# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2390/05 – 2024 ජුනි මස 24 වැනි සඳුදා – 2024.06.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39(1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 2121/33 හා 2019.04.30 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, 2019 අංක 87 හා 2019.04.11 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. පහත විස්තර වන එම ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් මෙතෙක් භාරගෙන නොමැත. එබැවින්, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 2121/33 හා 2019.04.30 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2019 අංක 87 හා 2019.04.11 වැනි දින දරන ආඥාවේ පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් මෙම නියමය මඟින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/16/2018/UDA/232.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: මහ/ඉ/අත්/381.
2024 මැයි මස 28 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 527 - නාවින්න ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නාවින්න ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක: CO/MHR/2018/656 හා 2018.12.20 දිනැති ප්‍රගමන අනුරේඛනයේ හි කැබලි අංක 1 සහ 2 දක්වා වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 01 – ගොරොක්ගහදෙනිය - ප්‍රමාණය: හෙක්. 0.3566**

උතුරට: වරිපනම් අංකය සොයාගත නොහැකි ඩී. පී. ගමගේ හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: ඇළ; දකුණට: ඇළ; බටහිරට: වරිපනම් අංකය සොයාගත නොහැකි ඩී. අයි. එම්. දේවරාජ හිමිකම් කියන ඉඩම.

02. **කැබලි අංක 02 – ගොරොක්ගහදෙනිය - ප්‍රමාණය: හෙක්. 0.0459**

උතුරට: වරිපනම් අංකය සොයාගත නොහැකි ඩී. පී. ගමගේ හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: ඇළ; දකුණට: ඇළ; බටහිරට: ඇළ.

EOG 06 – 0164

1A – G 042118 – 14 (2024/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39(1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1873/34 හා 2014.08.01 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, 2014 අංක 184 හා 2014.07.21 වැනි දින දරන ආඥාවේ පහත සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩම් කොටසෙහි භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් මෙතෙක් භාරගෙන නොමැත. එබැවින්, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1873/34 හා 2014.08.01 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2014 අංක 184 හා 2014.07.21 වැනි දින දරන ආඥාව මෙම නියමය මඟින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2013/D/301.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: AO/MN/02/08/2013.
2024 ජුනි මස 07 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය අංක MN/54 තුල්ලුකුඩිඉරිප්පු ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පෙසාලේ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක: Ma/MNN/2013/093 හා 2014.02.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ හි දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – පරන්කිකාමම් - ප්‍රමාණය: හෙක්. 1.1732**

උතුරට: අඩි පාර; නැගෙනහිරට: ශාන්ත මේරි පල්ලියට අයත් ඉඩම; දකුණට: ශාන්ත මේරි පල්ලියට අයත් ඉඩම; බටහිරට: ශාන්ත මේරි පල්ලියට අයත් ඉඩම.

EOG 06 – 0165